# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2360/57 - 2023 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2023.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : හල්/03/02/01/20(2).
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 3/J/95/WS/110.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම්/පරවශතාවන් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ/පරවශතාවේ විස්තර* :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ සුළු කොට්ඨාසයේ, හල්දුම්මුල්ල - 157A ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හල්දුම්මුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අංක ක.සි. 710559 හි කලාප අංක 01, පත්‍ර අංක 1 හා 2023.05.10 වැනි දින දරන කැඩැස්තර සිතියම් කැබලි අංක 01, කැබලි අංක 02, කැබලි අංක 03 වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.1013 පමණ වූ ඉඩම්වල විස්තර පහත දැක්වේ:

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: තවලම්මණ්ඩිය; විස්තරය: වත්ත, අවුරුදු 15-20 ක් පමණ වයසැති මිශ්‍ර වගාවකි; හිමිකම් කියන අය: අංක 366, හල්දුම්මුල්ල පදිංචි මිරිස්සේ ගම්හේවගේ ගාමිණී ජයන්ත මයා; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0381.

*මායිම් :*
*උතුරට* : න.මැ.මු.පි. 26හි කැබලි අංක 66 සහ 73; *නැගෙනහිරට* : න.මැ.මු.පි. 26හි කැබලි අංක 73 සහ කැබලි අංක 3; *දකුණට* : කැබලි අංක 3, න.මැ.මු.පි. 26හි කැබලි අංක 73, කැබලි අංක 2 සහ න.මැ.මු.පි. 26 හි කැබලි අංක 66; *බටහිර* : න.මැ.මු.පි. 26 හි කැබලි අංක 73, කැබලි අංක 2 සහ න.මැ.මු.පි. 26 හි කැබලි 66.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: තවලම්මණ්ඩිය; විස්තරය: ගෙවත්ත, අවුරුදු 15-20 ක් පමණ වයසැති මිශ්‍ර බෝග වගාවක්, වතුර ටැංකිය සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: කෙලින් වීදිය හල්දුම්මුල්ල පදිංචිව සිට මිය ගිය ගොලුහේවගේ ඩේවිඩ් සිල්වා, දැනට ඔහුගේ දියණිය වන පීල්ලේවෙල, යුදගනාව පංසල පාර, බුත්තල පදිංචි ගොඩහේවගේ දිල්රුක්ෂි ලක්මාලි නිල්මිණී ද සිල්වා මිය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0532.

*මායිම් :*
*උතුරට* : කැබලි අංක 1; *නැගෙනහිරට* : කැබලි අංක 1 සහ න.මැ.මු.පි. 26 හි කැබලි අංක 73; *දකුණට* : කැබලි අංක 1, න.මැ.මු.පි. 26 හි කැබලි අංක 73 සහ 66; *බටහිර* : න.මැ.මු.පි. 26 හි කැබලි අංක 73, 66 සහ කැබලි අංක 1.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: තවලම්මණ්ඩිය; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0100.

1A - G 040888 – 29 (2023/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*මායිම් :*

*උතුරට* : කැබලි අංක 1, න.මැ.මු.පි. 26 හි කැබලි අංක 73, 249 සහ 248; *නැගෙනහිරට* : න.මැ.මු.පි. 26හි කැබලි අංක 73, 249 සහ 248; *දකුණට* : න.මැ.මු.පි. 26හි කැබලි අංක 248; *බටහිර* : න.මැ.මු.පි. 26 හි කැබලි අංක 248, 73 සහ කැබලි අංක 1.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම් හා අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 පෙබරවාරි මස 21 වැනි දින පෙ.ව. 10.00ට හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024 පෙබරවාරි මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශතාවට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**කේ.ඒ.ජේ. ප්‍රියංගිකා,**
ප්‍රාදේශීය ලේකම්,
හල්දුම්මුල්ල.

2023 නොවැම්බර් මස 28 වැනි දින,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0344

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම (සංශෝධිත)

*මගේ අංකය* : KDS/TUM/04/01/01/10.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 363 බාංඅංග ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බාංඅංග ගමේ පිහිටි මහනුවර සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද මූලික ගම් පිඹුරු අංක ක.සි. 321296/01/01 හි පහත සඳහන් කැබැල්ල:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: නාරංඅත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: කේ.එම්.ඩී.පී.බී. කුලතුංග, "දිනකර" බාංඅංග, ගිරිහාගම, කුඹුරේගම; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0229.

*මායිම් :*

*උතුරට* : කේ.එම්.ඩී.පී.බී. කුලතුංග හිමිකම් කියන නාරංඅත්ත සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය; *නැගෙනහිරට* : මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය; *දකුණට* : ඇළ සහ කේ.එම්.ඩී.පී.බී. කුලතුංග හිමිකම් කියන නාරංඅත්ත; *බටහිරට* : කේ.එම්.ඩී.පී.බී. කුලතුංග හිමිකම් කියන නාරංඅත්ත.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් හා අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 මාර්තු මස 11 වැනි දින පෙ.ව. 09.00ට තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024 පෙබරවාරි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එස්. එම්. සී. ගුණරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
තුම්පනේ.

2023 නොවැම්බර් මස 29 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0345

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.